මාධ්‍ය ඔස්සේ සිදුවන ඇතැම් සෘණාත්මක ලේබල්කරණයන්ට තිත නොතැබිය යුතුදැයි පාඨක අපට ඇසීමට සිදුවන්නේ, එය සමාජයේ ශිෂ්ට සම්පන්න චින්තනයක් ප්‍රවර්ධනය සඳහා කෙතරම් අවකාශ ලබාදෙන්නේ ද යන ගැටළුවද සමගිනි. එසේම, අප කථා කරන ආකාරයේ සෘණාත්මක ලේබල්කරණයන් සමගින්, එම කොටස් සමාජය තුළ වඩ වඩාත් කොන් වීමත්, ඒ ඔස්සේ ඔවුන්ට පුනරුත්ථාපනයකින් හෝ නැවත සමාජයට එක් වීමට බාධා පැමිණීටත් ඉඩක් තිබේ.

මත්ද්‍රව්‍ය භාවිතා කරන්නවුන් හැඳින්වීම සඳහා භාවිතා වන "මත්ලෝලියා" වැනි යෙදුමක් එවැනි සෘණාත්මක ලේබල්ගත කිරීමකට එක් උදාහරණයකි (දිවයින, ජනවාරි 17, 18, 2022). මන්ද යත්, මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ කරුණු සමුදායක් හේතු කොට ගෙන සිදුවන, සුව කළ හැකි තත්වයක් මිස, හුදු මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමක් නොවන බැවිනි.

එසේ නම්,

1) ඔබ සිතන ලෙසට, "මත්ලෝලීන්" වැනි යෙදුමක් ඔස්සේ මත්ද්‍රව්‍ය ඇබ්බැහි වීම පිළිබඳව මෙන්ම මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන්නන් පිළිබඳවද වැරදි අදහසක් සමාජගත නොවන්නේ ද?

2) "මත්ලෝලීන්" වැනි යෙදුම් වෙනුවට, "මතට ඇබ්බැහි වූවන්", "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය වෙතැයි ඔබ නොසිතන්නේ ද?